www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගෝලීය සමාජ කැලඹීමක් පිලිබඳව යුරෝපයේ මාධ්‍ය අනතුරු අඟවයි

## Europe's media warn of global social unrest

**2010 ජුනි 02**

"අවතාරයක් යුරෝපය තුල හොල්මන් කරයි" යනුවෙන් කොමියුනිස්ට් ප්‍රකාශනය තුල කාල් මාක්ස් ලියන ලද්දේ, 1848 ඉතාලිය හා ප්‍රන්සය තුලින් ආරම්භ වී යුරෝපයෙන් වැඩි හරියක් වසාගත් විප්ලවවාදී පිපිරීම් මාලාවක් අද්දර දී ය.

මෑත දිනයන්හී දී, ගැඹුරුවන ආර්ථික අර්බුදයේ ඍජු ප්‍රතිපලයක් වශයෙන් විප්ලවවාදී මානයන්ගෙන් යුත් එවැනිම සමාජ කැලැඹීම් පිලිබඳව මාධ්‍ය ප්‍රකාශන ගනනාවක් අනාවැකි පල කලේය. යුරෝපය තුල යලි වතාවක් ජාතිකවාදී ආතතීන් ද ෆැසිස්ට් ව්‍යාපාර හා යුද්ධ පවා මතු වියහැකි වාතාවරනය ගැන බියජනක පෙරදැකීම් ද මෙම අනතුරු ඇඟවීම් සමඟ අත්වැල් බැඳගත්තේය.

උදාහරනයක් ලෙස ඉතිහාසඥ සයිමන් ස්කැමා මැයි 24 දා ෆයිනෑන්ෂල් ටයිම්ස් පත්‍රය තුල සඳහන් කලේ, අඩමාන තත්වය තවත් නරක් කිරීම මගේ අභිප්‍රාය නොවේ. මේ දැන් ඔබට වාතයේ බෙඩිබෙහෙත් ගඳ නොදැනෙනු ඇත. ඔබ කෝපාවිෂ්ය යුගයක එලිපත්තෙහි සිටින්නේ ද නැත. එහෙත් ඇමරිකාවේ හා යුරෝපයේ සමාජ නොමනාපයේ දීර්ඝ උනුසුම් ගිම්හානයක් පැහැදිලිව දැකගැනීමට හැකිව තිබේ.

ආර්ථික විනාශයේ ආරම්භයත්, සමාජ ප්‍රචන්ඩත්වය ඒකරාශී වීමත් අතර "විරාමයක්" නිතරම තිබෙන බවත් එම ආරම්භක කාලපරිච්ඡේදයේ "බියපත් අවමංගතවීම්වලින්" පසුව "ප්‍රචන්ඩත්වය සංවිධානාත්මකව බලමුලු ගැන්වීමක්" පිලිබඳ අන්තරාය පැමිනෙන බවත් ස්කිමා සඳහන් කලේ ය.

"මෙම ප්‍රකෝපකාරිත්වය සුපිරි ධනවතුන්ට හා මෙම අර්බුදයට වගකිව යුත්තන් වෙත යොමුවනු ඇත. ඒ, 1789 දී ප්‍රන්ස විප්ලවයේ දී බැංකු කරුවන් "ධනවත් ආත්මාර්ථකාමීන්" ලෙස ඉලක්කවූවා සේම "අපගේ ධනපතියන්ට" ද එරෙහිව එල්ල වීම ලෙස යයි" ඔහු ලියුවේ ය.

ඔබ්සර්වර් පත්‍රයේ හිටපු කතුවරයෙකු හා දැන් බ්‍රිතාන්‍යයේ කොන්සර්වේටිව්-ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සභාග ආන්ඩුවේ රාජ්‍ය අංශයේ වැටුප් කප්පාදුවේ උපදේශකයෙකු වන විල් හටන් "බ්‍රිතාන්‍යයේ අනාගතය අඩමානයි. යුරෝ මුදලේ කඩාවැටීමක් දේශපාලන හා ආර්ථික විනාශයක පලමු පියවර වනු ඇත. ආර්ථික වශයෙන් එය, තරගකාරී අවප්‍රමානයන්ට, නය පැහැර හැරීම්වලට, බැංකුවලට ඇපදීම්වලට, නය ගලායාම අවහිරවීමට, වෙලඳ ආරක්ෂනයන්ට සහ දීර්ඝ කාලීනව එකතැන පල්වීමට යුරෝපය ඇද දමනු ඇත. දේශපාලනිකව, පැරනි එදිරිවාදිකම් හා අවිශ්වාසයන් කිසිවිටෙකත් පහව නොගිය තතු හමුවේ අපගේ විසිරී යන මහාද්වීපය එකට තබාගැනීම සඳහා දරන්නාවූ කුමන වෑයමක් වුව ද වාෂ්පවී යනු ඇත. මතුව එනු ඇත්තේ, 1930 ගනන්වලට සමාන වූ යුරෝපයකි. එය, බියජනක, එකතැන පල් වන දුෂ්ට වර්ගවාදී හා ජාතිකවාදී දෘෂ්ටිවාදයන්ගේ ගොදුරක් වනු ඇතැයි" ඔහු ප්‍රකාශ කලේ ය.

මෙතෙක් දුරට, වඩාත් හෙලිදරව්කාරී අනතුරු ඇඟවීම මැයි 26 දා නිකුත් වූයේ ජර්මනියේ ජාත්‍යන්තර විකාශනය වන ඩොයිෂෙ වෙලි තුලිනි. ලිපිය ආරම්භ වූයේ, 2008 ගෝලීය ආර්ථික බිඳවැටීමේ බලපෑම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බෑන් කී මූන්, ජාමූඅ ප්‍රධානී ඩොමිනික් ස්ට්‍රාව්ස්-කාන් සහ ලෝක බැංකු ප්‍රධානී රොබට් සොලික් විසින් කල අනතුරු අඟවීම්වලට යලි අවධානය යොමුකරමිනි. උදාහරනයක් ලෙස "දියුනු ආර්ථිකයන් ද ඇතුලුව ලෝකයේ රටවල් වැඩි ප්‍රමානයක ඇති විය හැකි සමාජ කලබැගෑනි" පිලිබඳව ස්ට්‍රාව්ස්-කාන් අනතුරු ඇඟවූයේ ය.

1929 මහා අවපාතයෙන් මෙපිට ඇතිවූ දරුනුතම මූල්‍ය අර්බුදය වන වත්මන් අර්බුදයේදී වෙන කවරදාටත් වඩා එම අනතුරු ඇඟවීම් සම්පවී ඇති බව ඩොයිෂෙ වෙලි සඳහන් කරයි.

ග්‍රීසියේ ලක්ෂ ගනනකගේ විරෝධතා ගෙනහැර දක්වමින් "පෘතුගාලය හා ඉතාලිය වැනි මූල්‍ය දුබලතාවන්ගෙන් පෙලෙන යුරෝපයේ ආන්ඩු" එම ඉරනමටම මුහුන දෙන බවත් "ලෝකය පුරා සියලුම ජාතීන් නැගී එන සමාජ නොසන්සුන්තාවයක් ගැන කනස්සලුවී ඇති බවත්" අනතුරු ඇඟවීමක් ලෙස එය සඳහන් කරයි.

"මෙම රටවල්වල එක්රොක් වන ගැඹුරු කෝපය ලෝකය පුරා එම ආයතනවලටම, එම මිනිසුන්ටම, සහ ගෝලීය ධනවාදයේ අසාර්ථකත්වයටම එරෙහිව පැසවමින් තිබීම ගැන විශේෂඥයින් තුල කනස්සල්ලක් ඇතැ" යි වාර්තාව තවදුරටත් කියා සිටියි.

දිගට ඇදෙන ආර්ථික අර්බුදය "එක්සත් ජනපදය පවා ගැලවී නොයන, පාලන තන්ත්‍රයන්ට තර්ජනයක් ලෙස වැඩෙන අවදානමක්" මතුකරන බව එක්සත් ජනපද ජාතික බුද්ධි අංශයේ අධ්‍යක්ෂක ඩෙනිස් සී. බ්ලෙයාර් සෙනේට් සභාවේ බුද්ධි අංශ කමිටුවට අනතුරු ඇඟවූ ආකාරය ගැන එය සඳහන් කලේ ය.

දේශපාලන පෙරදැකීම් පිලිබඳ යුරෝපයේ පර්යේෂනාගාර මන්ඩලයේ සභාපති මරී-හෙලෙන් කයිලෝල්ගේ සහ මූල්‍ය හා දේශපාලන ප්‍රවනතා පිලිබඳ බුද්ධි මන්ඩලයේ පුරෝකථක හා ට්‍රෙන්ඩ්ස් සඟරාවේ ජෙරල්ඩ් සෙලින්ටේගේ අදහස් ඩොයිෂෙ වෙලි ගෙනහැර දක්වයි.

"ආර්ථිකයන් කඩාවැටෙන විට ග්‍රීසියේ සිදුවූ දේ ලෝකය පුරාම පැතිරෙනු ඇත.... වඩාත් නිෂ්චිතව රාජ්‍ය නය අර්බුදයන්ට මුහුන දී සිටින ස්පාඤ්ඤය, අයර්ලන්තය, පෘතුගාලය, ඉතාලිය, අයිස්ලන්තය, යුක්රේනය, හංගේරියාව, හා ඊට පිටු පසින් එක්සත් රජධානිය සහ එක්සත් ජනපදය තුල සමාජ කැලඹීම් වර්ධනය වනවා අපට දැක ගත හැකි" යැයි සෙලින්ටේ පැහැදිලි කලේ ය.

"1945 සිට හෝ ඊටත් පෙර යුරෝපයේ යටත් විජිතකරන ක්‍රියාවලියේ පටන් අප දන්නාවූ ලෝක පර්යායේ නිමාව, මෙම අර්බුදය විසින් කෙලින්ම ඇඟවුම් කරයි. එබැවින්, 60 වසරක් පුරා එක්සත් ජනපදය මාධ්‍ය කරගත් සමස්ත ගෝලීය වියමන ක්‍රමයෙන් බිඳවැටෙන්නේ සෑම වර්ගයකම කැලබැගැනි නිර්මානය කරමින්" යැයි කයිලෝල් අවධාරනය කලේ ය.

සමාජ නොසන්සුන්තාවය අවසන්වනු ඇත්තේ කොතැනකින් දැයි ඇසූ විට, ඇගේ සරල පිලිතුර වූයේ "යුද්ධය, සරලවම එයයි, එමෙන්ම භයංකරයි."

සමාජ කැලඹීම් පිටුපස සිටින්නේ කලහකාරීන් ය යන්න කලියෝල් හා සෙලින්ටේ යන දෙදෙනාම ප්‍රතික්ෂේප කලහ.

"මෙම ප්‍රතිචාරයට පිටුපසින් කිසිදු සංවිධානයක් නැහැ, එය මහජන ප්‍රතිචාරයක්" යයි සෙලින්ටේ පැවසුවේය. මාක්ස්ගේ අනුස්මරනීය ප්‍රතිපදානයන්ගේ ද පිහිට පතන සෙලින්ටේ, මෙය 'ලෝකයේ කම්කරුවනි එක්වව්' යන්නෙහි 21 වන සියවසේ අනුවර්ථනය යයි පැවසුවේය. ඔවුන්ට ගෙවීමට බල කෙරී ඇත්තේ "වැටෙන්ට ඉඩහල නොහැකි තරම් ලොකු" ඒවාට දුන් දැවැන්ත ඇපදීම්වල වන්දිය බව මිනිස්සු හොඳකාරව ම වටහාගෙන සිටිති. බදු ඉහල යන තරමට, වඩ වඩාත් රැකියා අහිමිවන තරමට, විරෝධතාවන්ගේ පරිමාව තව තවත් වැඩිවනු ඇත." යනුවෙන් ඔවුහු පැවසූහ.

මහාද්වීපය තුල සමාජ විප්ලවයේ වැඩෙන අනතුර යුරෝපයේ පාලකයින් කොතරම් බැරෑරුම්ව සැලකිල්ලට ගන්නේ ද යන්න මෙවැනි ප්‍රකාශ තුලින් දැකගත හැකිය. ඔවුන්ගේ උපදේශකයින් ඔවුන්ට පවසන්නේ ගැඹුරුවන ආර්ථික අර්බුදයේ නොවැලැක්විය හැකි නිෂ්පාදිතය එය බවයි. කම්කරුවන් කලින් දිනා ගත් සුභසාධන සහන හා සේවා කොන්දේසිවලින් ඉතිරි වූ යමක් වේ නම් එයත් විනාශ කර දැමීමේ ක්‍රියාදාමය තුල දී මහා බැංකු සහ ව්‍යාපාරයන්ගේ අවශ්‍යතාවයන් සඳහා සියලු බර කම්කරු පන්තිය මත පැටවීමේ ඔවුන්ගේ ම ප්‍රයත්නයන් නිශ්චිතවම තුඩු දෙන්නේ එයටම ය.

ප්‍රන්සයේ නව ධනපති-විරෝධී පක්ෂය, ජර්මනියේ වාමාංශික පක්ෂය සහ ග්‍රීසියේ සිරීශියා වැනි විවිධ මධ්‍යම පන්තික ව්‍යාජ වාම සංවිධාන පිම්බීම මගින් යුරෝපයේ පාලක පන්තීන්, කම්කරු පන්තියේ මහජන අරගලයන් හි සමාජවාදී විඥ්ඥානය හා දේශපාලන ස්වාධීනත්වය වර්ධනය වීම වලක්වමින්, කම්කරු පන්තියේ අරගලවලට මුහුන දීමට සූදානම් වෙමින් සිටී. එසේම, ආඥාදායක පාලන විධික්‍රම හඳුන්වාදීමටත් පුලුල් රාජ්‍ය මර්දනයන් උපයෝගී කර ගැනීමටත් ඔවුන් සූදානම් වෙමින් සිටී.

කම්කරු පන්තියට තමන්ගේම ප්‍රති-ප්‍රහාරයක් වර්ධනය කිරීමට අවශ්‍ය සමාජවාදී, විප්ලවවාදී ඉදිරිදර්ශනයක් හා නායකත්වයක් නොමැති වීම, පාලක පන්තීන්ට වර්තමානයේ සැලසී ඇති වාසියයි. ඒ වෙනුවට එම සංවිධාන, සියල්ලටමත් වඩා මහා ධනපතියන්ගේ පස්වන සේනාංකය ලෙස ක්‍රියා කරන වෘත්තීය සමිති, ප්‍රෝඩාකාරී ලෙස කම්කරු පන්තිය නියෝජනය කරන බවක් මාවාපාති.

ග්‍රීසිය, පෘතුගාලය, ඉතාලිය හා ස්පාඤ්ඤය තුල ඔවුන් විවිධ එක්-දින විරෝධතා වර්ජන සංවිධානය කලත්, බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති කොන්ග්‍රසය එවැනි කිසිවක් හෝ නොකලත්, සමිති ක්‍රියාකරන්නේ දැනුවත් මර්දනය ඔස්සේ කප්පාදු පිලිවෙත් පැනවීමට හා පන්ති අරගලය මැඩපවත්වා ගැනීමටයි. නිල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිතයන් හෝ වේවා කොන්සර්වේටිව් පරිපාලනයේ නියෝජිතයන් හෝ වේවා ඔවුන් (සමිති නායකයෝ) පාලකයින් සහ ආන්ඩු සමග සමීප සබඳතා පවත්වයි.

අවසානයේ දී ඒ තත්වයම, වඩදිය රැල්ලක් මෙන් පැනනගින පන්ති අරගල මෙම සංවිධාන පසු කර යනු ඇතැයි සහතික කරනු ඇත. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ට්‍රොට්ස්කි විසින් මනාව ඉදිරිපත් කරන ලද *සංක්‍රමන ක්‍රියාමාර්ගයේ* පෙරදැකීම් මත පදනම් වෙයිඃ "ජනතාවගේ දිශානතිය පලමුව තීරනය කරන්නේ දිරාපත් වන ධනවාදයේ වෛෂයික කොන්දේසි මඟින් ය. දෙවනුව පැරනි කම්කරු සංවිධානවල ද්‍රෝහී දේශපාලනයෙනි. මේ සාධක අතරින් පලමුවැන්න සත්තකින්ම තීරනාත්මකය. ඉතිහාසයේ නීති නිලධාරි පැලැන්තියට වඩා බලගතු ය."

ඉරනම්වාදයට හෝ ස්වයං තෘප්තියේ මූලයක් වනවාට වාඩා මෙම පෙරදැකීම විප්ලවවාදී නායකත්වය පිලිබඳ තීරනාත්මක ප්‍රශ්නය මතු කරයි. ලෝක අර්බුදයේ විප්ලවවාදී ඇඟවුම් සහ කම්කරු පන්තියේ පවත්නා විඥානය අතර හිඩස පියවීමේ අත්‍යාවශ්‍යය උපකරනය වන්නේ මාක්ස්වාදී පක්ෂයයි. සමාජවාදී විකල්පයක අවශ්‍යතාවය දැකගන්නා සියලු දෙනා සමාජවාදී සමානතා පක්ෂයට බැඳී එය ගොඩනැගීමේ තීන්දුව ගත යුතු ය.

ක්‍රිස් මාර්ස්ඩන්

© www.wsws.org